Department of Education,Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

## සති පාසල

**විෂය - පෙරදිග සංගීතය**

**පෙබරවාරි මාසය**

**ශ්‍රේණිය - 9**

**1 - සතිය**

**නිපුණතාව 1.0 : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 1.1: ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.**

**ක්‍රියාකාරකම 1.1.1 : බිලාවල් රාගයේ මධ්‍යලය ගීතය**

ඉහත 1.1.1 ක්‍රියාකාරකමට අදාළ ව සපයා ඇති අංක 01, 02 හා ,03 පැවරුම් සම්පූර්ණ කරන්න.

පැවරුම 01

i. බිලාවල් රාගයට අයත් පහත සඳහන් මධ්‍යලය ගීත ගායනය හොඳින් ශ්‍රවණය කරන්න. ඛ්‍යාල් ගායනා ශෛලිය පිළිබඳ මෙන් ම ඒවා ගයන පිළිවෙළ පිළිබඳව ද අවබෝධයක් එමගින් ලැබේ.


https://youtu.be/MTFNo0UinX8

ii. මෙම ගීතය ශ්‍රවණය කිරීමේ දී විශේෂයෙන් බිලාවල් රාග අංග පිළිබඳ ඔබේ අවධානය යොමු කරන්න.

iii. බිලාවල් රාගයේ මධ්‍යලය ගීතය පහත දක්වෙන අයුරින් නිවැරදි ව අභ්‍යාස පොතේ සටහන් කර ගන්න.

iv. හැකි නම් ස්වර පුවරුවක් ආධාරයෙන් හෝ ඉහතින් ඔබට ලබා දී ඇති link ආධාරයෙන් නාදමාලාව තහවුරු වන තෙක් ඉතා හොඳින් මෙම ගීතය ගායනයට හුරු වන්න.

බිලාවල් රාගය - මධ්‍යලය ගීතය - ත්‍රී තාලය




පැවරුම 02 (ලිඛිත)

i. බිලාවල් රාගයට අයත් රාග විස්තරය ලියා දක්වන්න. (මේලය,ජාතිය,වාදී,සංවාදී, මුඛ්‍යාංගය,ගානසමය සහිත ව)

පැවරුම 03

i. e තක්සලාව, e නැණපියස වෙබ් අඩවි හරහා හෝ අන්තර්ජාලයේ ඇතුළත් බිලාවල් රාගයට අයත් ශාස්ත්‍රීය ගායන වාදන (මධ්‍යලය ගීත) පරිශීලනයට යොමුවන්න. *නිර්දේශිත මධ්‍යලය ගීත - බඳවා ජය රන් දද/තුහි අදාර/මුරලි බජාවේ මෝහනා*

සැකසුම - W.N.ගයානි චන්ද්‍රකාන්ති - ර/නිවි/ඇලපාත මහා විද්‍යාලය